www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උකස් වෙලඳපොලේ යෝධයන්ට එක්සත් ජනපද ආන්ඩුව ඇපදෙයි

## US government bails out mortgage giants

**නික් බීම්ස් විසිනි**
**2008 ජුලි 14**

එක්සත් ජනපද භාන්ඩාගාරය හා ෆෙඩරල් මහ බැංකුව ජුලි 13 වන දින උකස් වෙලඳපොලේ යෝධයන් වන, ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් නගා සිටුවීමට හදිසි පියවර ගන්නා බව නිවේදනය කිරීමත් සමඟ, එක්සත් ජනපද මූල්‍ය පද්ධතියේ අර්බුදය ප්‍රධාන හැරීමක් ගනු ලැබුවේ වඩාත් නරක පැත්තටය.

ගලවා ගැනීමේ සැලැස්ම යටතේ, ප්‍රමානය හා කොන්දේසි පසුව තීරනය කිරීමේ පදනම මත ෆැනී හා ෆ්‍රෙඩී වෙත නිකුත් කරන නය දහරාව ඉහල නැංවීමේ නීති සම්පාදනය කරන ලෙසටත්, අවශ්‍ය නම් එහි වත්කම් මිලට ගන්නා ලෙසටත් කොන්ග්‍රසයෙන් ඉල්ලා සිටිනු ඇත. ඊට අමතරව, ෆෙඩරල් මහබැංකු මන්ඩලය නිව් යෝර්ක්හි එහි ශාඛාව වෙත "එවන් නය සැපයීම අවශ්‍යයයි හැඟීයන්නේ නම්" සමාගම් දෙකටම ඍජු නය සම්පාදනය සඳහා බලය පවරා ඇත. සති අන්තයේ බැංකු කරුවන්, මූල්‍ය ආයතන හා කොන්ග්‍රස් නායකයන් සමඟ පැවති හදිසි සාකච්ඡාවලින් පසුව ක්‍රියාත්මක කිරීමට නියමිත පියවර නිවේදනය කරමින් භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් කියා සිටියේ සමාගම් දෙක "අපගේ නිවාස නය පද්ධතිය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල බවත්, අප වත්මන් නිවාස අර්බුදයට විසඳුම් සෙවීමේදී ඒවා විශේෂ වැදගත් කමක් දරන" බවත්ය. ෆ්‍රෙඩී මැක් බිලියන තුනක නයකරයන් අලෙවිකිරීමට සැලසුම්කර තිබූ අද දින එම මැදිහත්වීම සිදු නොවුහොත් එය ගැටලු සහගත වනු ඇතැයි බිය පලවී තිබුනි.

මාර්තුවේ බෙයර් ස්ටියර්න්ස් ගලවාගැනීමේ මෙහෙයුමේදී මෙන්ම මෙහිදී ද, නිවේදනය නිකුත්කල කාල වකවානුවේ අර්ථය වූයේ, සතිය ආරම්භයේ ගෝලීය වෙලඳපොලවල් විවාත කිරීමට පෙර මෙම භීතිය තුරන් කිරීමයි.

"ආන්ඩුවේ අනුග්‍රහය ලබන ව්‍යවසායන්" (ජීඑස්ඊ) ගේ ජාත්‍යන්තර බැඳීම්වල ස්වභාවය නිසා පෙර නොවූ විරූ පියවර ගැනීම අවශ්‍යව ඇති බව පෝල්සන් කියා සිටියේය.

"ජීඑස්ඊ නයකර ලොව පුරාම මූල්‍යායතන විසින් හිමිකර ගෙන සිටියි. අපගේ මූල්‍ය පද්ධතියේ හා වෙලඳපොලෙහි විශ්වාසය හා ස්ථාවරත්වය සඳහා එහි ශක්තිය දිගටම පවත්වා ගැනීම අවශ්‍ය වේ" යයි ඔහු පැවසීය.

එක්සත් ජනපද නිවාස වෙලඳපොල බිඳවැටීමේ ප්‍රතිපලයක් ලෙස ඇතිකල අලාභයන්ට මුහුනදීම සඳහා, සමාගම් දෙකේ දුබල ප්‍රාග්ධන ශක්තියට අති හැකියාව පිලිබඳ භීතිය වැඩීයන තතු තුල, සතියක් පුරා පැවති කොටස් වෙලඳපොල කලබැගෑනියෙන් එම ආයතන දෙකේ කොටස් මිල සියයට පනහකට ආසන්නව කඩාවැටුනි. ඉන් පසුව මෙම හදිසි පියවර ප්‍රකාශයට පත්විය.

ෆැනී හා ෆ්‍රෙඩී අත රැඳී තිබෙන හෝ සහතික කරන ලද උකස්කර අගය ට්‍රිලියන 5 කට වැඩිය. එක්සත් ජනපද උකස් වෙලඳපොලේ මුලු අගය ට්‍රිලියන 12 කි.

ෆැනී මේ (ෆෙඩරල් ජාතික උකස් සංගමය) 1938 දී රූස්වෙල්ට් පරිපාලනය යටතේ ගොඩනගනු ලැබුවේ මහා අවපාත වකවානුව තුල නිවාස වෙලඳපොල පුම්බාලීමේ උත්සාහයක් ලෙසය. 1968දී කොන්ග්‍රසය විසින් එයට නව වර පත්‍රයක් ලබාදුන් අතර, ඒ අනුව එය පුද්ගලික අංශයෙන් ද අරමුදල් සපයාගැනීමේ හැකියාව සහිත ප්‍රසිද්ධ සමාගමක් බවට පත්විය. ෆ්‍රෙඩී මැක් (ෆෙඩරල් නිවාස නය උකස් සංස්ථාව) 1970 දී කොන්ග්‍රසය විසින් නිර්මානය කලේ ෆැනී සමාගමේ තරඟකරුවෙක් ලෙසය.

රජයේ නීති මඟින් ඒවා පිහිටුවනු ලැබීම නිසා සමාගම් දෙකට රජයේ වගකීම් සහතිකය හිමිවන බව පොදුවේ පිලිගැනුනු අතර, එය ඔවුන්ට වෙලඳපොලේ අඩුම පොලියට අරමුදල් සපයාගැනීමේ හැකියාව ලබාදෙන බවට අඟවුමක් විය. පසුගිය දශක තුන පුරා සමාගම් දෙක, එක්සත් ජනපද භාන්ඩාගාර වෙලඳපොලේ පරිමානය වූ ඩොලර් බිලියන 4500 ටත් වැඩි ප්‍රමානයක උකස් නය සහතික හා දේපල හිමිකම් සහිතව වේගයෙන් වර්ධනය විය.

ඒවා අවමුඛ වෙලඳපොල තුල ඍජු ලෙස මැදිහත් නොවුන ද, මහා අවපාතයෙන් පසුව එක්සත් ජනපදයේ නිවාස මිලගනන්වල ඇතිවූ තියුනුම කඩාවැටීම හමුවේ, සමාගම් දෙක බිලියන 11ක අලාභයකට පසුගිය මාස 9 තුල මුහුන දුන් අතර, ඔවුන් සතු අරමුදල්වල ප්‍රමානවත් භාවය පිලිබඳව උත්සුකයන් මතු කලේය.

ජූලි 9 වන දින සෙන්ට් ලුවිස් ෆෙඩරල් බැංකුවේ හිටපු සභාපති විලියම් පූලි, උකස් සමාගම් දෙකට ඇපදීමේ සම්භාව්‍යතාවය වැඩිවෙමින් පවතින බව ප්‍රකාශකිරීමත් සමඟ එම උත්සුකයන් වැඩි දියුනු විය.

පලවන කාර්තුවෙහි ෆ්‍රෙඩී මැක් තමන් සතු වත්කම්වල අගයට වඩා බිලියන 5.2 ක වගකීම් දරාසිටින අතර එමඟින් එය ප්‍රායෝගිකව බංකොලොත්වී ඇතැයිද, ෆැනී මේ හි වත්කම්වල " ශුද්ධ අගය" සියයට 66 කින් වැටී ඇති බැවින් එලඹෙන කාර්තුව තුල එය රින විය හැකි බවද ඔහු කියා සිටියේය.

ජූලි 11 වන දින නිව්යොර්ක් ටයිම්ස් පත්‍රය වාර්තා කලේ සමාගම් දෙකෙහි ගැටලු උග්‍ර වුවහොත් ඒවා "සංරක්ෂන තත්වයට" පත්කල හැකි බවයි. සංරක්ෂන තත්වය යටතේ ස්ථාවර භාවය යලි ඇති කරන තෙක් මූල්‍යායතනය පවත්වාගෙන යාමට නිසි බලධරයෙක් හෝ ආයතනයක් පත්කරනු ලබයි.

සමාගම් දෙකේ ශක්‍යතාවය ගැන හටගත් භීතිය හමුවේ ආන්ඩුවේ, මූල්‍ය හා බැංකු කවයන් තුල හදිසි පියවර පිලිබඳ සාකච්ඡා ආරම්භ විය. පෝල්සන් අවධාරනය කලේ මේතාක් දුරට ආන්ඩුවේ උත්සුකය වන්නේ ෆ්‍රෙඩී මැක් හා ෆැනී මේ තවදුරටත් ඒවායේ වර්තමාන රූපය වන "කොටස් හිමියන්ට අයිති සමාගම්" ලෙස පැවතිය යුතුය යන්නය. මක්නිසාද යත්, ආන්ඩුව විසින් පූර්න පරිමානයෙන් පවරාගැනීම හෝ ජනසතු කිරීම යන විකල්පය, එක්සත් ජනපදයේ මූල්‍ය තත්වය පිලිබඳ පුලුල් ඇඟවුම් ගැබ්කර ගන්නා බැවින්ය.

ෆ්‍රෙඩී හා ෆැනී හි නය හා බැඳීම් අත් පත්කර ගැනීමේ අර්ථය, එක් රැයකින් එක්සත් ජනපද ශුද්ධ නය ප්‍රමානය සියයට 50 කින් ඉහල යාමයි. එය එක්සත් ජනපදයේ දල දේශීය නිෂ්පාදිතයට සමාන නය කන්දරාවක් වනු ඇත.

විශ්වාසය ගොඩනැඟීමේ හඬක් නඟමින් සෙනේට් බැංකු කමිටුවේ සභාපති ඩිමොක්‍රටික් පක්ෂ ක්‍රිස් ඩොඩ් 13 වන දින සීඑන්එන් වෙත ප්‍රකාශ කලේ ෆ්‍රෙඩී හා ෆැනී යන දෙකම මූල්‍යමය වශයෙන් යහපත් තත්වයක පවතින බවයි.

"මෙහිදී වැදගත් වන්නේ සාධකයන්ය. එම සාධක නම් ෆැනී හා ෆ්‍රෙඩී හොඳ තත්වයක පවතීය යන්නයි. ඔවුන් සතුව අවශ්‍යවාටත් වඩා ප්‍රාග්ධනය ඇත. වඩාත් නිවැරදිව කිවහොත් නීතිමය වශයෙන් අවශ්‍යවාටත් වඩා - මූල්‍ය වෙලඳපොලට පිවිසීමේ හැකියාව ඔවුන් සතුය. ෆෙඩරල් බැංකු සභාපති ද, භාන්ඩාගාර ලේකම් ද ඒවායේ නිරෝගී භාවය ගැන ඇති තරම් දේ කියා ඇත." යනුවෙන් ඔහු පැවසීය.

පසුගිය වසරේ අත්දැකීම් සලකා බලන විට එවන් "දිරිගැන්වීම්" වැඩි ප්‍රතිපල ගෙන නොඑනු ඇත. ඩොඩ් පසුගිය සතියේ කල එවැනිම ප්‍රකාශයන්ට අවඥා සහගත ලෙස ප්‍රතිචාර දක්වමින් *වෝල්ස්ට්‍රීට් ජර්නලය* කියාසිටියේ සෙනේට් සභාපතිට අනුව, ෆෙඩරල් බැංකුවට එම සමාගම් ගලවාගැනීමට සිදුවන තරම්ම ඒවා සුරක්ෂිතය යනුවෙනි.

ජූලි 10 වන දින ෆෙඩරල් බැංකු සභාපති බෙන් බර්නන්කෙ හා පෝල්සන්, මන්ත්‍රන සභා මූල්‍ය කමිටුව හමුවේ පෙනීසිටිමින් අවධාරනය කලේ "ෆැනී හා ෆ්‍රෙඩී හි බේරුම්කාර ෆෙඩරල් මන්ත්‍රන සභා ව්‍යවසායකත්වය, ප්‍රමාද දෝෂයකින් සොයාගෙන ඇත්තේ සමාගම් අවශ්‍ය තරමින් අරමුදල් සතුව සිටින බවයි. බෙයාර්ස්ටියර්න්ස් අත්පත්කර ගැනීමට පෙර ද ඒ හා සමාන සහතික නිකුත් කර තිබුනි." යනුවෙනි.

සියල්ලන්ගේ අවධානය ෆැනී හා ෆ්‍රෙඩී වෙත යොමුවී තිබෙන අතර තුර කැලිෆෝනියාවේ ඉන්ඩිමැක් බැංකුව බිඳවැටීම මගින් සලකුනු කලේ එක්සත් ජනපද නිවාස හා මූල්‍ය අර්බුදයේ ගැඹුරයි.

පැසඩෙනාහි පදනම් වූ උකස් නය දෙන්නා, වත්කම් බිලියන 32 ක් සතුකර ගෙන සිටින අතර, අරමුදල්වලින් බිලියන 1.3 ක් දින 11 තුල ක්ෂය වී යාමත් සමඟ 11 වන දින ෆෙඩරල් බේරුම්කරුවන් විසින් එහි වත්කම් අත්අඩංගුවට ගන්නා ලදී. ඒඑල්ටී-ඒ වර්ගයේ නය පිලිබඳ විශේෂඥයන් වන ඉන්ඩිමැක් - සිය වත්කම් හා ආදායම් මුලුමනින්ම ප්‍රකාශයට පත් නොකල නය ඉල්ලුම්කරුවන්ට නය දීම - පරිමාව අතින් එක්සත් ජනපද උකස් නය දෙන්නන්ගෙන් 9 වන විශාලතම බැංකුව ලෙස හඳුනාගෙන ඇත.

1984 ඉලිනොයිස් කොන්ටිනෙන්ටල් හා 1988 වසරේ ස්ටොක්ටන්හි ඇමරිකානු ඉතුරුම් හා නය සමායතනය බිඳවැටීමෙන් පසුව, එක්සත් ජනපද බැංකු ඉතිහාසයේ තෙවන විශාලතම අසාර්ථකත්වය ලෙස හඳුන්වන බැංකුවේ බිඳවැටීමෙන්, ෆෙඩරල් තැන්පතු රක්ෂන සමාගමට බිලියන 4 සිට 8 දක්වා අලාභයක් සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය, සමාගම සතු බිලියන 53 ක තැන්පතු රක්ෂන අරමුදලෙන් සැලකිය යුතු කුට්ටියකි. තවත් බැංකු රූටා වැටෙන තතු යටතේ එය වෙත තවත් හිමිකම් ඉල්ලීම් ගලාඑනු ඇතැයි ද අපේක්ෂිතය.

මූල්‍ය අර්බුදයේ සමස්ත ප්‍රමානය පෙන්නුම් කරනවාට අමතරව ෆැනී හා ෆ්‍රෙඩී ගලවාගැනීමේ මෙහෙයුම, එය දිගහැරෙන වේගය ද සලකුනු කරයි. 10 වන දින පෝල්සන් හා බර්නන්කේ කොන්ග්‍රසයට කියා සිටියේ, ඔවුන් නව නීති පැනවීමක් අපේක්ෂා නොකරන බවයි. යන්තම් තෙදිනක් ගතවන විට, ඊලඟ දින කිහිපය සඳහා පවා තවත් පියවර අනවශ්‍ය බවට සහතික වීමකින් තොරව ම, හදිසි රෙගුලාසි ගොන්නක් ඔවුහු පෙරට ගෙන ආහ.

© www.wsws.org